Department of Education,Sabaragamuwa Province/ Weekly School



විෂය - නාට්‍ය හා රංග කලාව

කාර්ය පත්‍රිකා - 06

12 ශ්‍රේණිය - තෙවන වාරය

සැකසුම - සකුන්තලා මුණසිංහ

**නිපුණතාවය 3.5 : නිර්දිෂ්ට පෙළට අදාළ ව රූපණයේ යෙදෙයි.**

**පාඩම : කුවේණි පෙළට අදාළ ව තෝරාගත් අවස්ථා නිරූපණය කිරීම.**

**ඉගැනුම් පල :**

- නිර්දිෂ්ට පෙළෙහි චරිත අවබෝධයෙන් යුතු ව නිරූපණය කරයි.
- චරිතයක් නිර්මාණය වීම සඳහා බලපාන සාධක ප්‍රායෝගික ව අවබෝධ කර ගනියි.
- කණ්ඩායම් වශයෙන් එක් ව නාට්‍ය අවස්ථාවක් නිරූපණය කරයි.
- චරිත පිළිබඳ ව සොයන්නටත් අපූර්වත්වයෙන් යුතු ව ඒවා නිරූපණය කරන්නටත් පෙලඹේ.
- නාට්‍ය අවස්ථාවක් ඇසුරින් නාට්‍ය පිටපත සහ චරිත අර්ථකථනය කරන අයුරු ප්‍රකාශ කරයි.
- රංගනය සඳහා පූර්ව සූදානම වැදගත් බව ප්‍රකාශ කරයි.

➢ ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්...

1) කුවේණි නාට්‍ය පෙළ හොඳින් කියවන්න.
2) කුවේණි නාට්‍ය පිළිබඳ ලියැවී ඇති ලේඛන අධ්‍යනය කරන්න.
3) කුවේණි නාට්‍ය නරඹන්න.
- ඒ ඇසුරින් කුවේණි නාට්‍යයේ චරිත,චරිත නිරූපණ,නාට්‍ය ශෛලිය,අනුරූපන පිළිබඳ හොඳින් අධ්‍යනය කරන්න.
(e-තක්සලාව,e-නැණ පියස,ගුරු ගෙදර,මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක භාවිතා කර වැඩිදුර අධ්‍යනයේ යෙදෙන්න.)
4) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්,websites,ඉගෙනුම් ආධාරක :-
   I. e නැණ පියස - 12 ශ්‍රේණිය - නාට්‍ය හා රංග කලාව ගුරු මාර්ගෝපදේශය

- ආශ්‍රිත අතිරේක ග්‍රන්ථ
  - මහා වංශය
  - රාජාවලිය
  - කුවේණි අස්න
  - වයඹ ජන කථා හා වෙනත් ජන ශ්‍රැති

➢ ඇගයීම

1. නිර්දිෂ්ට පෙළෙන් ඔබ කැමති නාට්‍යමය අවස්ථාවට අදාළ ව පහත දැක්වෙන තොරතුරු වගුවක සම්පූර්ණ කරන්න.
   - එම දෙබස අයත් නාට්‍යයේ ශෛලිය.
   - ඔබට ලැබුණ නාට්‍යමය අවස්ථාව හමු වන්නේ කුමන රිද්මයක,කුමන ස්ථානයක නාට්‍ය පවතින විටද?
   - නාට්‍යමය අවස්ථාවේ පරිසරය, දේශය, සමාජ ස්වභාවය
   - එම අවස්ථාවට අයත් වන චරිතවල ඉතිහාසය, වර්තමානය සහ අනාගතය
   - වයස
   - සමාජ තත්ත්වය

- එම අවස්ථාවට චරිතය පැමිණෙන්නේ කොහි සිට කුමන ස්වභාවයකින් ද යන්න
-- එම අවස්ථාවෙන් පසු ව චරිතය යන්නේ කුමන ස්ථානයක කුමන තත්ත්වයකට ද යන බව
-- චරිතයේ ශාරීරික ශක්ති සහ දුබලතා
- රුචි-අරුචිකම්
- වේෂභූෂණ සහ එහි ස්වභාවය
- බාහිර ස්වභාවය හා අංග රචනය
- සමාජ සම්බන්ධතාවල ස්වරූපය
- අවස්ථාවට අදාළ දෙබස
- අභ්‍යන්තර චරිත ලක්ෂණ සහ චලන

• නාට්‍යයේ පසුතල නිර්මාණ සහ නාට්‍යෝපකරණ
• ආලෝකකරණය
• සංගීතය
• අධ්‍යක්ෂවරයා ගේ නාට්‍ය පිළිබඳ අර්ථකථනය
• පිටපත් රචකයා ගේ අර්ථකථනය
• එම අවස්ථාවේ වේදිකාවේ සිටින චරිත සහ ඒවායෙහි ස්වභාවය
• ප්‍රේක්ෂාගාරයේ ස්වභාවය

2.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සති පාසල ක්‍රියාකරකම කරන්න.

➢ පසු ක්‍රියාකාරකම්

1.කුවේණී නාට්‍යයේ චරිතයක් තෝරා ගෙන එම චරිතයේ ස්වභාවය එසේ වීමට හේතු විමර්ශනාත්මක ව පැහැදිලි කරන්න.